රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils & Local Government

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk

මගේ අංකය / எனது இல / My No: HA/3/7/28-4
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.01.09

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

<u>පරිපාලන ග්‍රාම නිලධාරී වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම - 2024</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද මගේ සමාංක HA/3/7/28-4 හා 2023.12.18 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ හා මෙම අමාත්‍යාංශයේ ස්ථාන මාරු නියෝග අනුව පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම් සම්බන්ධයෙන් විශේෂයෙන් දිනයක් සඳහන් කර ඇති අවස්ථා වලදී හැර අනෙකුත් සියළුම පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ 2024 වාර්ෂික ස්ථාන මාරුවීම් මේ වන විට ක්‍රියාත්මක කර ඇතැයි අපේක්ෂා කරමි. තවද, මෙතෙක් එම ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කර නොමැති නම් වහාම ක්‍රියාත්මක වන පරිදි අදාළ ස්ථාන මාරු වීම් ලද නිලධාරීන් විධිමත්ව සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළයුතු අතර, ස්ථාන මාරුවීම් ලද සේවා ස්ථානයේ රාජකාරී භාර ගන්නා ලෙස දැන්විය යුතුය.

03. තවද, උක්ත ස්ථාන මාරු වීම් එලෙසම ක්‍රියාත්මක කර ඇතැයි සළකා නවක පරිපාලන ග්‍රාම නිලධාරී ස්ථානගත කිරීම් මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන අතර, එම ස්ථාන මාරු නියෝග නිසි ලෙස ක්‍රියාත්මක නොවුවහොත් ගැටළු ඇතිවිය හැකි බව අවධාරණය කරන අතර මේ පිළිබඳව අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් පෞද්ගලිකවම සැලකිලිමත්විය යුතුය.

එච්.එම්.නන්දසේන
අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

පිටපත - 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා මෙතෙක් නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කර නොමැති පරිපාලන ග්‍රාම නිලධාරීන් - කරු. වහාම නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීම සඳහා